**කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය - 2023**
**-------------------------------------------------------------**

කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය හා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර් ජාතික අරමුදල (IFAD) අතර 2016 අප්‍රේල් 26 දින එළඹි අංක 2000001447 දරන ණය අරමුදල් ගිවිසුමේ IX වාවස්ථාවේ 9.03 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ණය අරමුදල් ගිවිසුම අනුව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශය තුළ කුඩා තේ හා රබර් වතු හිමියන්ගේ ඵලදායී, ලාභදායී හා නම්‍යශීලී ආර්ථික කටයුතු තවත් වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය අරමුදල් ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 8,502 කට සමාන වූ එජඩො මිලියන 65.4 වන අතර ඉන් රු. මිලියන 3,349.30 කට සමාන වූ එජඩො මිලියන 25.77 ක් සැපයීම සඳහා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර් ජාතික අරමුදල සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 5,153 ශ්‍රී ලංකා රජයේ බැංකු, ප්‍රතිලාභීන් හා පෞද්ගලික අංශය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ කටයුතු 2016 අගෝස්තු 15 දින ආරම්භ කරන ලද අතර, 2021 අප්‍රේල් 23 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය අවසන් කරන දිනය 2023 සැප්තැම්බර් 30 දින දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධව විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක්

නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| සංරචකය | ක්‍රියාකාරකම | 2023 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය ඒකක | ළඟා කරගෙන ඇති කාර්යසාධනය ඒකක | | | |
| කුඩා තේ වතු හිමියන්ගේසංවර්ධනය | කුඩා තේ වතු හිමියන් සඳහා වෙළඳපොළ මත පදනම් වූ නිෂ්පාදන සහාය | ඉඩම් හෙක්. 4,500 | ඉඩම් හෙක්. 4,131 | 2016 සිට 2023 සැප්තැම්බර් දක්වා තෝරාගත් දිස්ත්‍රික්ක හයක තේ ඉඩම් හෙක්ටයාර් 5500ක් ප්‍රතිසංස්කරණය කර නැවත වගා කිරීමට ව්‍යාපෘතිය විසින් සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සැලසුම් කළ පරිදි 2016 දී ව්‍යාපෘතියේ මෙහෙයුම් ආරම්භ කිරීමට නොහැකි වීම හේතුවෙන් තේ ඉඩම් ප්‍රතිසංස්කරණය කර නැවත වගා කිරීමේ ඉලක්කය හෙක්ටයාර් 4,500 දක්වා සංශෝධනය කරන ලදී. | එය සත්‍යයක් වන අතර, ව්‍යාපෘතිය අවසානයේ තේ නැවත වගා කිරීමේ මුළු ප්‍රගතිය 92% කි. | සැලසුම් තළ පරිදි එහි ක්‍රියාකාරකම් සිදු කළ යුතුය. |

### 2.2 ඌන උපයෝජිත සම්පත්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සහනාධාර ක්‍රම යටතේ 2017 සිට 2023 දක්වා කාල පරිච්ඡේදය තුළ දිස්ත්‍රික්ක හයේ හෙක්ටයාර 242 ක මුළු භූමි ප්‍රමාණයක තේ නැවත වගා කිරීමට බලපත්‍ර ලබාගත් ප්‍රතිලාභීන් 805 දෙනෙකු රු.35,931,707 ක මුල් ගෙවීම් ලබාගෙන විවිධ හේතුන් මත කිසිදු කටයුත්තක් ආරම්භ කර නොතිබුණි. | මුල් ගෙවීම් නොගෙවන්නන්ගෙන් ආපසු අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග මත පදනම්ව අතැති ශේෂය රු. මිලියන 35.93 (ඇමරිකානු ඩොලර් 108,884)<br>සමථ මණ්ඩල වෙත යොමු කරන ලද ප්‍රමාණය රු. මිලියන 10.02 (ඇමරිකානු ඩොලර් 30,383)<br>නීතිමය ක්‍රියාමාර්ග සඳහා යොමු කර ඇති ප්‍රමාණය රු. මිලියන 25.91 (ඇමරිකානු ඩොලර් 78,501)<br>IFAD විසින් ලබා දෙන ලද අනුමැතියට අනුව, 2023 තුන්වන කාර්තුවෙහි සාධාරණීකරණය කරන ලද මුළු මුදලෙන් US$ 108,884 ක් අඩු කර ඇති අතර IFAD හි වාර්තා වලින් නුසුදුසු වියදම් ඉවත් කරන | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අධීක්ෂණයෙන් අරමුදල් භාවිතා කිරීම සහ තීරණය කරන ලද ක්‍රියාකාරකම් සිදුකිරීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ලදී. එබැවින්, එය 2023 තුන්වන කාර්තුවේ සාධාරණීකරණයෙන් රු. මිලියන 35.93 ක් (ඇමරිකානු ඩොලර් 108,884) ගළපා ඇති අතර ඉතිරිය ණය අරමුදලට සාධාරණීකරණය කරන ලදී. | |
| (ආ) | "ජාතික තොග ආගණනය පිළිබඳ අනාවරණ චාරිකා සහ කුඩා තේ වතු හිමියන් සඳහා වන ප්‍රතිපත්ති සංවර්ධන සම්මන්ත්‍රණ සහ අවසන් කිරීමේ වැඩසටහන්" සඳහා වර්ෂය තුළ රු.2,710,807ක් හෙවත් වෙන් කළ අරමුදලින් සියයට 90ක් භාවිතා කර තිබුණද, වසර තුළ භෞතික ඉලක්කයෙන් සියයට 25ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. | කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ උපදෙස් මත RRI සහ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය මගින් ව්‍යාපෘතියේ තොග ගණන් ගැනීම් කටයුතු සිදු කරන ලදී. රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අදාළ නිර්දේශ සහ අවශ්‍ය අනුමැතිය ලබා දීමෙන් පසු ගෙවීම් සිදු කරන ලදී. නමුත් ව්‍යාපෘතියට අවශ්‍ය දෘඩ පිටපත් ගණන ලැබෙන තෙක් ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය වාර්තා කර නොතිබුණි. | කාල සීමාව තුළ ඉලක්කය ළඟා කර ගත යුතු අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අධීක්ෂණයෙන් ක්‍රියාකාරකම් සිදු කළ යුතුය. |
| (ඇ) | "ශුන්‍ය පාංශු පුනරුත්ථාපනය (SQI) සඳහා උපදේශනය" සඳහා වෙන් කරන ලද අරමුදලින් රු.843,362 ක් හෙවත් සියයට 110 ක් යොදවා තිබුණද, වසර තුළ භෞතික ඉලක්කයෙන් සියයට 67 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. | ව්‍යාපෘතිය විසින් 2023 වසරේදී SQI ක්‍රමයට තේ සිටුවීමට සැලසුම් කර තිබුණද, නියමිත වේලාවට ක්ෂේත්‍රවලට ගොස් සැලසුම් කර ඇති වැඩ සිදු කරවා ගැනීම සඳහා තේ පර්යේෂණ ආයතනය හරහා ශුන්‍ය පාංශු පුනරුත්ථාපන (SQI) උපදේශක වෙත අවශ්‍ය ප්‍රවාහන පහසුකම් නොමැතිකම හේතුවෙන් සැලසුම් කළ භෞතික ඉලක්කය සපුරා ගැනීමට නොහැකි විය. | සැලැස්මේ ක්‍රියාකාරකම් ව්‍යාපෘති කාල සීමාව තුළ නියමිත පරිදි සිදු කළ යුතුය. |
| (ඈ) | ඒකාබද්ධ ප්‍රගති සමාලෝචන රැස්වීම් 03ක් සඳහා රු. 450,000ක් වෙන් කර තිබුණද, රු. 2,641,055 ක් එනම් වෙන් කළ මුදලට වඩා සියයට 587 ක් වැඩියෙන් වියදම් කර තිබුණි. | 2022 වසරේ රබර් වගා කිරීම නිම කිරීම හේතුවෙන් මොණරාගල සහ අම්පාර දිස්ත්‍රික්කවල රබර් සංරචකයේ ප්‍රගති සමාලෝචනය සඳහා 2023 AWPB හි සීමිත ප්‍රතිපාදන රු. 450,000 ක් ලබා දී තිබුණි. මොණරාගල සහ අම්පාර දිස්ත්‍රික්කවල රබර් සංරචකය සම්පූර්ණ කිරීමේදී මතු වූ අනපේක්ෂිත ප්‍රායෝගික ගැටලු හේතුවෙන් රබර් සංරචකය සාර්ථකව ක්‍රියාත්මක කිරීම පිළිබඳ ස්වාධීන සමාලෝචනයක් ස්වාධීන පරීක්ෂණ කණ්ඩායමක් විසින් සිදු කිරීමට සිදු විය. ඒ අනුව, ඒකාබද්ධ ප්‍රගති සමාලෝචනයේ එම සීමිත අයවැය ප්‍රතිපාදනවලට එරෙහිව එම වියදම් වාර්තා කිරීමෙන් අයවැය ප්‍රතිපාදනවලට සාපේක්ෂව සැළකිය යුතු වැඩි වීමක් වාර්තා විය. | සාධාරණ ලෙස ප්‍රතිපාදන වෙන්කිරීම් හා ගෙවීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම් 18ක මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 06 සිට සියයට 70 දක්වා සහ සියයට 02 සිට සියයට 57 දක්වා පරාසයක පැවතුණි. | 2023.09.30 වන දිනට ව්‍යාපෘතිය අවසන් වීමත් සමඟ තේ නැවත වගා කිරීම සම්පූර්ණ කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම හේතුවෙන්, ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර සජීවීකරණ ශිල්පීන්ගේ සහ TSHDA හි TIs හි සම්පූර්ණ ධාරිතාව 2023 AWPB හි මුලින් සැලසුම් කර තිබූ සමහර ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන් නිම කිරීමට වඩා තේ නැවත වගා කිරීම සඳහා යොදවන ලදී. එසේම, ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගේ සහනාධාර ගෙවීම සඳහා ශ්‍රී ලංකා රජයේ අරමුදලට ගැළපෙන ප්‍රදානයක් ලෙස IFAD විසින් ඇමරිකානු ඩොලර් ණය අතිරික්තය භාවිතා කිරීමට අනුමැතිය ලබා දීම සුවිශේෂී අවස්ථාවක් වන අතර, ව්‍යාපෘතිය විසින් එවැනි වාසියක් හැකි උපරිම ලෙස ලබා ගැනීම සඳහා කුඩා තේ වතු අංශය දියුණු කිරීම සඳහා එහි ප්‍රතිලාභීන් යැවීමට කටයුතු කරන ලදී. | මූල්‍ය හා භෞතික ඉලක්ක නියමිත කාල සීමාව තුළ ඉටු කර ගත යුතුය. |

**2.3 නිශ්ක්‍රිය සම්පත්**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 ක්‍රියාකාරී සැලැස්මට අනුව ජෛව විවිධත්ව තක්සේරුව කර ගෙන යාමේ ප්‍රධාන ක්‍රියාකාරකම් හතරක්, රබර් වගා බිම් ප්‍රමාණය පිළිබඳ සමීක්ෂණය, වෘත්තීය සංවාද සඳහා Blog සහ Vlog කණ්ඩායම් සංවර්ධනය කිරීම සහ දැනුම බෙදා ගැනීමට ජාතික මට්ටමේ, දිස්ත්‍රික් මට්ටමේ වැඩමුළු, කැෆේ හෝ කෝපි සංග්‍රහයන් සංවිධානය කිරීම, ව්‍යාපෘතියේ අවසානය දක්වා සිදු කර නොතිබුණි. | රේඛීය අමාත්‍යංශය විසින් ගනු ලැබූ තීරණය හේතුවෙන්, උපදේශකවරයා විසින් 2023.06.20 දින සිට ව්‍යාපෘතිය නවතා දැමූ අතර, ඒ හේතුවෙන් ක්‍රියාකාරකම් අඩාල විය. | සැලැස්ම නිසි ලෙස සකස් කළ යුතු අතර තීරණය කරගත් පරිදි ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන ක්‍රියාකාරකම් සිදු කළ යුතුය. |